# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ    அதிவிசேஷமானது    EXTRAORDINARY

අංක 909/13 – 1996 පෙබරවාරි 09 වැනි සිකුරාදා – 1996.02.09
909/13 ஆம் இலக்கம் – 1996 ஆம் ஆண்டு பெப்புருவரி மாதம் 09 ஆம் திகதி வெள்ளிக்கிழமை
No. 909/13 - FRIDAY, FEBRUARY 09, 1996

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)    (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)    (Published by Authority)


## I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී. –බී. 21/78 IV

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වන වගන්තිය සමග කියවිය යුතු 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1996 පෙබරවාරි මස 08 වන දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 1996 අංක 1 දරන විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, 1996 පෙබරවාරි මස 12 වන දින සිට එය ක්‍රියාත්මක වන්නේය.

2. මේ නියමාවලිය, (මෙහි මින් මතු ''පනත'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වන වගන්තිය යටතේ කරනු ලැබූ නියමය මගින් පිහිටුවන ලද (මෙහි මින් මතු ''ආයතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අදාළ වන්නේය.

3. (මෙහි මින් මතු ''විශ්වවිද්‍යාලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට මේ ආයතනය අනුයුක්ත කරනු ලැබිය යුතුය.

4. පනතේ සහ යම් උචිත පාලන පත්‍රයක විධිවිධානවලට සහ කොමිෂන් සභාවේ බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට යටත්ව, පහත දැක්වෙන කටයුතු කිරීමට ආයතනයට බලය ඇත්තේය :–

(අ) ශිෂ්‍යයන් ඇතුළු කර ගැනීම ;

(ආ) ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි සඳහා ඉගැන්වීම, පුහුණුව සහ පර්යේෂණ සඳහා කටයුතු සැලැස්වීම ;

(ඇ) විවිධ විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රවලින් ප්‍රදානය කළ යුතු පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා කවරේද යි, විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව තීරණය කිරීම ;

1 A - D 039247 - 1,060 (96/02)